**පුත්තලම ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූලි 24 දිනද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පුත්තලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල්කිරීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු උසාවි දඩ රු.50,440ක් ලැබිය යුතු ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | ජර්නල් සටහන මගින් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවේ තිබුණු රු.24,600ක් වටිනා වීථි පහන් තොග ශේෂයක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | ජර්නල් සටහන මගින් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (iii) | ප්‍රාදේශීය සභාවට අයත් නොවන ඉඩම්වල ඉදිකිරීම් හා අළුත්වැඩියා වෙනුවෙන් ඉකුත් වර්ෂවල සහා අරමුදලින් දරන ලද රු.2,460,762ක මුදලක් ගිණුම්ගත කර තිබුණි. | ඉඩම්වල නිවැරදි අයිතීන් තහවුරු කර ගත යුතු වේ. | එම ඉඩම්වල අයිතිය නිරවුල් කරගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දරන ලද ප්‍රාග්ධන වැය රු.10,816,480ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | ජර්නල් සටහන මගින් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (i) 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 23ක එකතුව රු.96,117,145ක් වූ අතර එයින් වර්ෂ 05ක කාලයක් ඉක්මවූ ශේෂ එකතුව රු.5,966,890ක් විය. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතු වේ. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |
| (ii) 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 15ක එකතුව රු.44,908,760ක් වූ අතර, එයින් වර්ෂ 05 ඉක්මවූ ශේෂ එකතුව රු.2,023,178ක් විය. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී ණය හිමි ශේෂ තුල ඇති කපා හැරිය හැකි ණය හිමි ශේෂ කපා හැරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**-----------------------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (i) එකතුව රු.192,229,538ක් වූ ගිණුම් විෂයයන් 05කට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූලා‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | අදාළ ලේඛන, ශේෂ සනාථ කිරීම්, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා ඔප්පු යාවත්කාලීනව නඩත්තු කළ යුතු බවත්, විගණනයට අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදී. |
| (ii) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මස 08 දිනැති අංක 1302 දරන රු.25,250ක වවුචරය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ගෙවීම් වවුචර විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | අදාළ වවුචරය හමුවූ වහාම විගණනයට ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) 128 වගන්තිය | ප්‍රාදේශීය සභාව විසින් පරිහරණය කරනු ලබන දේපළ 42ක අයිතිය පවරාගෙන නොතිබුණි. | පනතේ අදාළ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | සියළු ඉඩම් ඇතුළු සියළු දේපළ ඉදිරියේදී නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කරමි. |
| | (ii) 129(2)(ඊ) වගන්තිය | ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු රු.3,061,208ක් වටිනාකමැති බදු කුලී, කඩ කුලී විධිමත් පරිදි ලබාගැනීමට පියවරගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අවසන් නිවේදන නිකුත් කිරීමට කටයුතු කරන ලද අතර නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හැකි ඉක්මනින් ආරම්භ කරන බව දන්වා සිටිමි. |
| | (iii) 136 වගන්තිය | හිඟ වරිපනම් සහ අක්කර බදු රු.2,392,545ක් අයකර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වරිපනම් සහ අක්කර බදු ආදායම් බිල්කර ඉදිරි වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කරමි. |
| | (iv) 143 වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ පිහිටි රු.110,968,234ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සෑම වසර 05කට වරක් තක්සේරු කර ඒ අනුව බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | නව තක්සේරුව අනුව ආදායම් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ තක්සේරුව 2019 වසරේදී නිම කළ අදාළ තක්සේරු වාර්තා නොලැබීම මත 2005 වසරේ තක්සේරුව මත තවදුරටත් බදු අයකරමින් පවතී. ආදායම් පරීක්ෂක මගින් තාවකාලික තක්සේරුවක් සිදුකර |

| | | | |
|---|---|---|---|
| | | | අදාළ ගාස්තු අය කෙරේ. |
| (v) 158 වගන්තිය | වරිපනම් හා අක්කර බදු හිඟ මුදල් අයකර ගැනීම සඳහා එම බදු ගෙවිය යුතු අයගේ දේපළ තහනමට ගෙන හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ අදාළ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී දේපළ තහනමට ගෙන හෝ අදාළ හිඟ මුදල් පියවා ගැනීමට කටයුතු කරමි. |
| (vi) 159(1) වගන්තිය | සභාවට අයත් දේපළ කුලියට දීමෙන් අයවිය යුතු රු.3,061,208ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවට අයත් දේපළ කුලියටදීම මත අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) අංක 194 රීතිය | පවත්වා තිබූ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් යාවත්කාලීන කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉන්වෙන්ට්‍රි ලේඛන නියමයන් පරිදි ඉදිරියේදී යාවත්කාලීන කිරීමට කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) අංක 203 රීතිය | සභාවේ දේපළ පිළිබඳ සමීක්ෂණ මණ්ඩල වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී සමීක්ෂණයක් පවත්වා වාර්තා විගණනය වෙත වාර්තා ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (iii) අංක 218 රීතිය | සභාවේ සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩලයක් පත් කර පරීක්ෂා කරවිය යුතු වේ. | ඉදිරියේදී ඒ සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර අවශ්‍ය කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මු.රෙ.1645(අ) | වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | ලොග් පොත් යාවත්කාලීනව පවත්වා ගත යුතු වේ. | මේ වන විට යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) මු.රෙ.1647(අ) (ආ) | වාහන 03ක් අළුත්වැඩියාවේදී රු.383,035ක් වටිනා අමතර කොටස් 12ක් ආපසු ගබඩාවට භාරදී නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | වහාම ඒවා ගබඩාව වෙත ලබාගෙන අදාළ සටහන් යොදා විගණනය වෙත ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි. |

## 1.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල විධිමත් අනුමැතියකින් තොරව බිල්කළ ආදායම් හා ලැබිය යුතු ආදායම් රු.28,476,615ක් ඉකුත් වර්ෂවල ලාභවලින් කපා හැර තිබුණි. | ආදායම් කපා හැරීමට විධිමත් අනුමැතියක් ලබා ගත යුතු වේ. | ඉදිරියේදී නිවැරදි අනුමැතියක් තුලින් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.27,946,331ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.33,247,648ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| - | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 3,145 | 3,094 | 3,002 | 2,393 | 1,284 | 3,585 | 1,130 | 2,306 |
| කුලී | 14,764 | 13,585 | 17,796 | 3,621 | 13,394 | 12,560 | 8,548 | 7,272 |
| බලපත්‍ර ගාස්තු | 2,000 | 2,486 | 2,486 | - | 4,300 | 2,063 | 20,633 | - |
| වෙනත් ආදායම් | 79,734 | 41,943 | 71,079 | 73,992 | 83,645 | 81,700 | 69,641 | 59,933 |
| | 99,643 | 61,108 | 94,363 | 80,006 | 102,623 | 99,908 | 99,952 | 69,511 |

රැස්කළ ආදායම තුල වර්ෂයේ බිල්කළ ආදායමෙන් රැස්කළ ආදායම සහ හිඟහිටි ආදායමෙන් රැස්කළ ආදායමද ඇතුලත්ව තිබේ.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 100ක ආදායමක් රැස් කිරීමට ඇස්තමේන්තු සකස් කර තිබුණද, පෙර වර්ෂයන්ට අදාළව හිඟ ලැබීම්ද ඇතුළුව රුපියල් මිලියන 94ක් පමණක් රැස්කර තිබුණි. ඒ අනුව බිල් කිරීමට අදාළ රැස්කිරීම රුපියල් මිලියන 61ක් විය. ඉකුත් වර්ෂයේ රුපියල් මිලියන 70ක් වූ හිඟ ආදායම් සමාලෝචිත වර්ෂය වන විට රුපියල් මිලියන 80ක් වී තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.1,776,349ක් වූ අතර, එම හිඟය තුල වර්ෂ 05ට වැඩි රු.936,061ක හිඟ ශේෂයක් විය. සභාව 2006 වර්ෂයෙන් පසුව 2019 වර්ෂය දක්වා ප්‍රධාන තක්සේරුවක් සිදුකර නොතිබුණු අතර ඉදිකිරීම් නිම කරන ගොඩනැගිලි සම්බන්ධව ආදායම් පරීක්ෂකවරුන් විසින් තාවකාලික තක්සේරුවක් සිදුකර වරිපනම් බදු අයකර ගත යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතු අතර වරිපනම් තක්සේරුව කාලානුරූපීව කළ යුතු වේ. | වරිපනම් බදුවල 2019.12.31 දක්වා ඇති හිඟ ශේෂය තුල විශාල හිඟයක් දුම්රිය දෙපාර්තමේන්තුවේ දේපළවලට අදාළ වන අතර එම දේපළවලට අදාළව රු.433292ක මුදලක් පවතී. අප විසින් එම මුදල අයකර ගැනීමට දිගින් දිගටම කටයුතු කරමින් පවතින අතර අනෙකුත් හිඟ බදු මුදල්ද ඉදිරියේදී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

### 2.2.4 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමියන්ගෙන් අයවිය යුතු හිඟ අක්කර බදු මුදල රු.616,196ක් වූ අතර එම හිඟයෙන් රු.359,916ක් අවුරුදු 05 කට වැඩි කාලයක් සඳහා විය. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 134(3) වගන්තියට අනුව බල ප්‍රදේශයේ හෙක්ටයාර් 01ට වැඩි ඉඩම්වලින් අක්කර බදු අයකර ගත යුතුව තිබුණද, සභාව ඒවා අයකර ගැනීමට උනන්දුවක් දක්වා නොතිබුණු අතර වර්ෂ 05කට වරක් බල ප්‍රදේශයේ සමීක්ෂණයක් සිදුකර අක්කර බදු අයකර ගත හැකි ඉඩම් හඳුනා ගැනීමට සභාව පියවර ගෙන නොතිබුණි. | අයවිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතු අතර අදාළ සමීක්ෂණයන් සිදු කළ යුතු වේ. | අක්කර බදු ලේඛනවල පවතින දෝෂ හේතුවෙන් වාර්ෂිකව අය කර ගැනීමට හැකි මුදල් ප්‍රමාණය ඉතා අඩු අගයක් ගන්නා බැවින් ඉදිරියේදී සිදු කිරීමට සැලසුම් කර ඇති අක්කර බදු සමීක්ෂණයෙන් පසු අදාළ දෝෂ නිවැරදි කර නිවැරදි වටිනාකම් මත බිල් කිරීම් සිදුකිරීමටත් දෝෂ සහිත බිල් කිරීම් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියෙන් කපා ඉවත් කිරීමටත් කටයුතු යොදන බව දන්වා සිටිමි. |

### 2.2.5 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී රු.3,061,208ක් විය. එයින් වර්ෂ 05කට වැඩි කඩ කුලී රු.30,525ක් හා වර්ෂ 01-05 අතර කාලයට අදාළ රු.315,525ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. | අදාළ කඩ කුලී හිඟ අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. දේපළ සන්තකය පවරාගෙන නඩු මාර්ගයෙන් ඉතිරි හිඟ ශේෂය අය කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලේඛනයට අනුව ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.23,137,228ක් හා මුද්දර ගාස්තු රු.28,045,336ක් විය. | අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට පියවර ගත යුතු වේ. | උසාවි දඩ හිඟය මුද්දර ගාස්තු ඉදිරියේදී නියමිත පරිදි ලබාගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මං මාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 52ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා සඳහා පුත්තලම ප්‍රාදේශීය සභාව අතුරු ව්‍යවස්ථා 52ක් පනවා ඇති බව කාරුණිකව දැනුම් දෙමි. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් (සංවර්ධන සැලැස්ම නමින්) පිළියෙල කර තිබුණද, 2014 පෙබරවාරි 17 දිනැති PED/RED/01/04/2014/01 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 04 ඡේදයට අනුකූල නොවීය. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේදී අදාල චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ඇ) ප්‍රතිපාදන නොසැලසීම**

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පිළියෙල කර තිබූ වාර්ෂික සැලැස්මට අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් 04ක් සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන නොසැලසීම නිසා ඒවා ඉටු කළ නොහැකි වී තිබුණි. | අදාළ අරමුණු සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි අයවැයවලින් අදාළ ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ඈ) අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාර්ෂික සංවර්ධන සැලැස්මේ අරමුණුවලින් බැහැරව ක්‍රියාත්මක කළ ක්‍රියාකාරකම් 16ක් විය. | වාර්ෂික සංවර්ධන සැලැස්මේ අරමුණුවලින් බැහැරව කටයුතු නොකළ යුතු වේ. | උක්ත කරුණට අදාළව සමහර කර්මාන්ත සිදුකර ඇති අතර, ඉදිරියේදී හදිසි ආපදා තත්ත්වයකදී හැර, අයවැය ලේඛනයෙන් පරිබාහිරව කටයුතු නොකරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ඉ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සංවර්ධන සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 10ක් ඉටු කිරීම සඳහා රු.146,930ක මුදලක් | කර්තව්‍යයන් ඉටු කිරීමේදී අපේක්ෂිත නිමවුම් | 2019 වර්ෂයේ සංවර්ධන සැලැස්මේ දක්වා ඇති කර්තව්‍යන් 10 ඉටු කිරීම සඳහා ඇස්තමේන්තු කර ඇති මුළු |

| | | |
|---|---|---|
| වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි. | මට්ටම් කරා ළගාවීමට කටයුතු කළ යුතු වේ. | මුදලම වැයකර නොතිබුණද එම වැඩසටහන් සභා නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් සිදු කර ඇති බැවින් සභා අරමුදලින් වැය දරා නොමැති නිසා මෙම මුදල් අතිරික්තයක් පවතින බව කාරුණිකව දන්වමි. |

**(ඊ) සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු කසළ බැහැර කිරීමේ ස්ථානය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. දෛනිකව ආසන්න වශයෙන් කසළ ටොන් 04ක ප්‍රමාණයක් එකතු කරනු ලබන අතර 2012 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරියෙන් ලැබූ ප්‍රතිපාදන හා සභා අරමුදල් උපයෝගී කරගෙන ඉදිකළ සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ වැඩ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි. ප්‍රාදේශීය සභාව කසළ බදු අයකිරීම සඳහා රු.100,000ක් ඇස්තමේන්තු කර තිබුණද එම බදු පනවා නොතිබුණි. සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සමාලෝචිත වර්ෂය තුල සභා අරමුදලින් රු.11,783,645ක වියදමක් දරා තිබුණි. | විධිමත් කසළ කළමනාකරණ ක්‍රියාවලියක් සඳහා යොමු විය යුතු වේ. | පුත්තලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශාලත්වය වර්ග කිලෝ මීටර් 240ක් වුවද පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව වරිපනම් කලාපයේ පමණක් කසළ රැස් කිරීමේ කටයුතු සිදු කරනු ලබන අතර ඉදිරියේදී වරිපනම් බල ප්‍රදේශය පුළුල් කිරීමේදී එම බල ප්‍රදේශයේ කසළ එකතු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(උ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී තිබුණු අතර එම අරමුණු ළඟා කර ගැනීමේ මූලික පියවරයන් ගණනාවක් සභාව ආරම්භ කර තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමට කටයුතු කළ යුතු වේ. | 2015 – 2030 අතර කාලය තුළදී තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේ මූලික පියවරයන් ගණනාවක් කෙරෙහි අවධානය යොමුකර ක්‍රියාත්මක කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 104ක් වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තථ්‍ය සේවත සංඛ්‍යාව 105ක් විය. ප්‍රාථමික තනතුරු 10ක අතිරික්තය තුල අනුමත නොමැති පුස්තකාල කම්කරු, කාර්යාල කම්කරු යන තනතුරු 02ක් විය. | විධිමත් ලෙස පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ අනුමැතීන් සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය සඳහා යොමු කර ඇති බව කාරුණිකව දන්වමි. |
| (ආ) | පසු ගිය වර්ෂවලදී සේවය හැර ගිය, වැඩ තහනමට ලක් වූ හා විශ්‍රාම ගිය සේවකයින් 09 දෙනෙකුගෙන් රු.35,494ක සේවක ණය ශේෂයක් අයවිය යුතුව තිබුණි. | අයවිය යුතු සේවක ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිලධාරීන් දැනුවත් කොට අයකර ගෙන සහ අදාළ ඇපකරුවන්ගෙන්ද අයකරගෙන ඇත. පසුගිය ශේෂවලින් කොටසක් අයකරගෙන ඇති බව කාරුණිකව දන්වමි. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර 70කින් බදු දුන් කඩ කාමර 09ක් සඳහා ගිවිසුම්ගත වී නොතිබුණි. වසර 05කට වරක් තක්සේරු කුලිය සංශෝධනය කළ යුතු වුවද, සභාව සතු කඩ කාමර 46ක අවසන් තක්සේරුව 2005 වර්ෂයේදී සිදුකර තිබුණි. තවද ඉතා පැරණි ගිවිසුම්ගත කඩ කාමර 19ක්ද විය. මාසික බදු කුලී හිඟ හිටි කඩ කාමර 28ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | වැදගත් ලියකියවිලි ආරක්ෂිතව තබාගත යුතු අතර ගිවිසුම්ගතවීම කඩිනමින් කළ යුතු වේ. | මෙම කඩ කාමරවල පැරණි ගිවිසුම් අස්ථානගත වී ඇති බැවින් අදාල පාර්ශවකරුවන් සමග ගිවිසුම්ගතවීම සඳහා පැමිණෙන ලෙස කිහිප වතාවක් දන්වා යැව්වද අදාළ පාර්ශවකරුවන්ගේ නොපැමිණීම මත ගිවිසුම්ගතවීම අතපසු වී ඇත. ඉදිරියේදී අදාළ ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර විගණනය වෙත ඉදිරිපත් කරමි. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය වෙමින් පවතින ප්‍රචාරක දැන්වීම් පිළිබඳ සමීක්ෂණය කර ලැයිස්තු | විධිමත් පරිදි ලේඛන පවත්වා නිශ්චිත ක්‍රමවේදයකට අනුව කටයුතු කළ යුතු | විගණනය විසින් එම අඩුපාඩුව පෙන්වා දුන් පසු එම සමීක්ෂණය ආරම්භ කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | |
|---|---|---|
| පිළියෙල කර නොතිබුණු අතර ඒ සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සභාව සතු නොවීය. ගාස්තු අයකිරීම පිළිබඳව විධිමත් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර ගාස්තු අය නොකර දැන්වීම් පුවරු හා දැන්වීම් ප්‍රදර්ශනය නොකළ යුතු ස්ථාන හඳුනාගෙන නොතිබුණි. | වේ. | අදාළ ස්ථාන හඳුනාගෙන වාර්තා කරන ලෙස අදාල අංශ වෙත උපදෙස් ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. විගණනය විසින් පෙන්වා දුන් පරිදි ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

---------------------------

### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් ගොඩනැගිලි සහිත ඉඩම්වල ගොඩනැගිල්ල ඉදිකිරීමට වැයකළ වියදම පමණක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණු අතර ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී මෙම ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වමි. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල පවරා නොගත් දේපළ 142ක් පැවති අතර සති පොළවල්, පුස්තකාල, පෙර පාසල්, පොදු නල ළිං, සුසාන භූමි හා ක්‍රීඩා භූමිද විය. සමාලෝචිත කාල පරිච්ඡේදය තුලත් අදාළ දේපළවල ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සභාව මගින් සිදු කෙරෙමින් පැවතුණි. | අදාළ පවරා ගැනීම් කඩිනමින් කළ යුතු වේ. | මෙම දේපළවලින් කොටසක් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට කටයුතු කර ඇත. ඒකක 17ක් සඳහා පවරා දීමට කටයුතු කරන බවට අදාල රජයේ කාර්යාල විසින් ලිපි මගින් අප හට දන්වා ඇත. පවරා ගැනීමට නියමිත ඉඩම් 40 පවරා ගැනීමට පුත්තලම සහ මුන්දලම ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇත. |

**3.4.3 වාර්ෂික භාණ්ඩ /තොග සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාවේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය ප්‍රධාන කාර්යාලය, පුස්තකාල හා සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයට පමණක් සීමාවී තිබුණි. | වාර්ෂික සමීක්ෂණයට සියළු ස්ථාන ඇතුලත් විය යුතු වේ. | ඉදිරියේදී අදාළ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් නිර්දේශිත භාණ්ඩ අපහරණයන් අදාළ ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කර ලේඛන යාවත්කාලීන කළ යුතු වේ. | 2018.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව නිර්දේශිත භාණ්ඩ වෙන්දේසි කර හා විනාශ කර ඇති නමුත් ලේඛනවලින් ඉවත් කිරීම සිදු නොකර ඇති අතර වහාම එම ලේඛන යාවත්කාලීන කර විගණනය වෙත ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය අනුව පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචිත වර්ෂය මෙන්ම ඉකුත් වර්ෂ වෙනුවෙන්ද පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කළ යුතු වේ. | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ආ) අනුව මින් ඉදිරියට විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට වග බලා ගන්නා බවද කාරුණිකව දන්වා සිටිමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට ප්‍රාග්ධන වැය විෂයයන් 21ක් සඳහා සැලසූ රු.13,700,000ක ප්‍රතිපාදනය එලෙසම ඉතිරි වී හෝ වෙනත් වැය ශීර්ෂවලට මාරු කර තිබුණි. | සැලසුම් කළ ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතු වේ. | විවිධ හේතු නිසා ව්‍යාපෘති සැලසුම් කළ පරිදි සිදුකිරීමට පුත්තලම ප්‍රාදේශීය සභාවට නොහැකි වූ අතර ඉදිරි වර්ෂවලදී සැලසුම් කළ පරිදි මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමෙන් අනතුරුව සැලසුම් කළ ව්‍යාපෘති සිදුකිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 4.2 අභ්‍යන්තර විගණනය

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ අභ්‍යන්තර විගණනය කාර්යාල සේවක පරිපාලනයට පමණක් සීමාවී තිබුණි. | ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණුකිරීම හා කාර්යසාධනය ඉහළ නැංවීමට අභ්‍යන්තර විගණනය යොදා ගත යුතු වේ | සියළු මූල්‍ය කටයුතු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් තුලින් පරීක්ෂා කරනු ලබන අතර ඉදිරියේදි පවතින අභ්‍යන්තර පාලන ක්‍රම වැඩිදියුණු කිරිමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |